# ශ්‍රී ලංකාවේ උපාධිධාරි නොවන පූර්ව සේවා ගුරු පුහුණු පාඨමාලාව විසි එක්වන සියවසට කොතෙක් දුරට ගැලපේද යන්න පිළිබඳව කරනු ලබන විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.පී. සුනිල්
94/ M. Phil/34

STOCK VERIFICATION
14 DEC 2013
UCLIB
499955
Class No.
Acc. No. 499955
University of Colombo Library Sri Lanka

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධනය
කොළඹ විශ්ව විද්‍යාලය
2000

## සංක්ෂිප්තය


ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ඉතිහාසය විමසීමේදී පෘතුගීසි යුගයේදීත්, ලන්දේසි යුගයේදීත්, බ්‍රිතාන්‍ය යුගයේදීත් ගුරු පුහුණුව ලබා දී ඇත. මෙම ගුරු පුහුණුව ආයතන මගින් දී ඇත. මෙම ආයතනවලට සිසුන් තෝරා ඔවුන්ට ගුරු පුහුණුව ලබා දී ස්ථිර ගුරු පත්වීම් දී ඇත. බ්‍රිතාන්‍ය යුගයේදී මොනිටර් ක්‍රමය අනුව ගුරු සේවයට පිවිසියේ පුහුණුවක් නොලත් නවකයින්ය. එම යුගයේදීම 1903 වසරේදී ගුරු විද්‍යාල ඇරඹී තිබූ අතර, මොවුන්ට ගුරු පුහුණුව ලබා දිණි.

වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලිය ඉතා සංකීර්ණය. ගුරුවරයාගේ කාර්ය භාර්ය ඉතා පුළුල්ය. අද ජාතියක ජීවනාලිය බඳු අනාගත පරපුර සඳහා නව ලොවක් ගොඩ නගන්නන්ගේ කාර්ය ගුරුවරුන් වෙත පැවරී ඇත. වත්මන් පරපුරේ දැනුම, කුසලතා, ආකල්ප කෙරෙහි වත්මන් ගුරුවරයා සැලකිය යුතු බලපෑමක් කරයි. ගුරුවරුන් වෘත්තියෙහි න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අංශයන්හිද මනා පුහුණුවක් ලත් අය වීම අතිශයින් වැදගත් වේ.

වැඩිවන ජනගහණයට අනුව වැඩි වන අධ්‍යාපන ඉල්ලුමට සරිලන සේ නුපුහුණු ගුරුවරුන් පත් කිරීම මෑත කාලයේදී ඉතා සීඝ්‍රයෙන් සිදු විය. මේ නිසා පූර්ව සේවා ගුරු පුහුණුවක අවශ්‍යතාවය ඉතා තදින්ම අවශ්‍ය බව පෙනී ගිය හෙයින් 1981 ධවල පත්‍රිකාවෙන් පූර්ව සේවා ගුරු පුහුණුව ශ්‍රී ලංකා රජය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන ඇත. ඒ අනුව පූර්ව සේවා ගුරු පුහුණුව ලබා දීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨ ආරම්භ කළහ. සිසුන් බඳවා ගැනීම මුලින්ම සිදුවූයේ 1985 වසරේදීය. එදා සිට අද දක්වා සිසුන් ඇතුලත් කරගෙන අවුරුදු දෙකක පුහුණුවෙන් පසුව සීමාවාසික අවුරුද්දක් පාසල තුල ගත කර ස්ථිර ගුරු සේවයට පිවිසෙති. වෙනස් වන සමාජ පරිසර තුලින් වර්තමාන පාසල තුලට පිවිසෙන සිසුන්ගේ අධ්‍යාපන පරමාර්ථ මුදුන්පත් කිරීමේ කාර්යභාරය පැවරී ඇත. මෙම කාර්යභාරය සපුරාලීමට පූර්ව සේවා ගුරු පුහුණු පාඨමාලා තුලින් ලැබේ දැයි විමසා බැලීම ඉතාමත්ම කාලෝචිතය. අධ්‍යයනයේ අරමුණු පහත ආකාරයට ගොනු කරගන්නා ලදී.

- ශ්‍රී ලංකාවේ වර්තමාන පූර්ව සේවා ගුරු අධ්‍යාපනය සවිස්තරව විමසීම
- පූර්ව සේවා ගුරු අධ්‍යාපනයේ වෘත්තීය පුහුණුවට අදාල විෂය නිර්දේශය විමසා බැලීම
- වෘත්තීය පුහුණුව කොතෙක් දුරට වර්තමාන පාසලට ගැලපේද ? යන්න විමසා බැලීම
- අනාගතයේදී අධ්‍යාපනයෙන් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණුවලට කොතෙක් දුරට මේ වෘත්තීය පුහුණුව අදාල වේද ? යන්න විමසීම
- අධ්‍යයනය තුලින් ඇති වන ගැටළු හා විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීම

අධ්‍යාපන විද්‍යා පීඨවලින් පුහුණුව ලැබූ සීමාවාසික කාලයේදී පාසල්වල ඉගැන්වීමේ යෙදෙන ගුරු සිසුන් 568 දෙනෙකු විද්‍යා පීඨ හතකින් තෝරා ගන්නා ලදී. එකී ගුරු සිසුන් ප්‍රායෝගික ගුරු පුහුණුවේ යෙදෙන පාසල් හතකින් 9 වසරේ ඉගෙනුම ලබන සිසුන් 560 දෙනෙකු නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. ගුරු අභ්‍යාසලාභීන් සඳහා ප්‍රශ්නාවලියක්ද (උපග්‍රන්ථ 03) පාසල් සිසුන් සඳහා වෙනත් ප්‍රශ්නාවලියක්ද (උපග්‍රන්ථ 05) දෙන ලදී. මෙහිදී ලැබුණු ප්‍රතිචාර විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව අධ්‍යාපන මූලධර්ම හා දර්ශනය අධ්‍යාපන මනෝ විද්‍යාව. ප්‍රායෝගික ගුරු පුහුණුව හා පාසල් අනුබද්ධ ගුරු පුහුණුව සහ යහපත් ගුරු ආකල්ප පිළිබඳව ගුරු අභ්‍යාසලාභීන් ලබා ගත යුතු විෂය දැනුම හා කුසලතාවයන් ප්‍රමාණවත් නොවන බව හෙළි විය. ඊට හේතු විය හැක්කේ අධ්‍යාපන විද්‍යා පීඨ විෂය මාලාව හා ඉගැන්වීම් ක්‍රමයේ තිබෙන දුර්වලතාවයන්ය. මානව සංස්කෘතික විකාශනයත් සමග ඇරඹි අධ්‍යාපනයද විවිධ සමාජයීය ආර්ථික දේශපාලන දාර්ශනික විද්‍යා තාක්ෂණික වෙනස්වීම් වලට අනුරූපව අනුවර්තනය වීම ඉතිහාසය පුරාම දිස්වන්නකි. අධ්‍යාපනය එහි ස්වභාවය හා ව්‍යුහය අන්තර්ගතය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව මෙතෙක් ඉදිරිපත්ව ඇති පැදගත් අධ්‍යාපනික සංකල්පතුලින් විසිඑක්වන සියවසේ අධ්‍යාපනයේ අන්තර්ගත වියයුතු යැයි අවධාරණය කෙරෙන දැන ගැනීමට ඉගෙනීම. වැඩ කිරීමට ඉගැනීම. දිවි පැවැත්ම සඳහා ඉගැනීම සහ එකමුතුව ජීවත්වීම සඳහා ඉගැනීම යන ඉගැනුම් අවස්ථා සාර්ථකව ලඟා කර ගත හැකි විවේචන විනිශ්චයකට එළඹිය හැකි සමාජයක් බිහි කිරීමට අවස්ථාව උදා වේ. ඒ සඳහා දත්ත වලින් තොරතුරුත්. තොරතුරු වලින් දැනුමත් දැනුමෙන් ප්‍රඥාවත් වෙනස්කර ගත හැකි නිපුණතා වලින් යුත් විශිෂ්ඨ ගුරුවරයකු වීමේ අවස්ථාව අධ්‍යාපන විද්‍යා පීඨ ගුරු අභ්‍යාසලාභීන්ට උදාවනු ඇත. මේ නිසා ගුරු පුහුණු පාඨමාලාවේ සෑම විෂයයකම ශිෂ්‍ය ක්‍රියාකාරකම් අඩංගු ශිෂ්‍ය කේන්ද්‍රිය විෂයමාලාවකින් එකී දුර්වලතාවයන් අඩු කර ගත හැකිය. මෙහිදී නව තාක්ෂණික ශිල්පී ක්‍රම යොදාගෙන ගුරු අභ්‍යාසලාභීන්ට අත්හදා බැලීම් කිරීමටද අවස්ථාවක් දීමෙන් එකී දැනුම හා කුසලතාවය ලබා ගැනීමට හැකියාව ලැබේ. එවිට විසි එක් වැනි සියවසේ පාසල් අධ්‍යාපනයට සම්බන්ධ වීමේ හැකියාව මෙම ගුරු අභ්‍යාසලාභීන්ට ලැබේ.